# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2014 අගෝස්තු මස 01 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2014.08.04 දින නිකුත් කරන ලදී)**


## පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 3.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : 2013 අංක 30 දරන පළාත් පාලන ආයතන පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ අතුරු විධානය ඉවත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එය (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 66අා වගන්තියේ (4) වන උපවගන්තියට කරන ලද සංශෝධනයට ආනුශංගික වේ. එම ඉවත් කිරීම හේතු කොට ගෙන ඇතිවන නීතිය බලපෑම වනුයේ අයවැයක් හෝ පරිපූරක අයවැයක් අවස්ථාවෝචිත පරිදි මහනගර සභාවකට, නගර සභාවකට හෝ ප්‍රාදේශීය සභාවකට නැවත ඉදිරිපත් කිරීමේ දී ඉහත කී සංශෝධනවලට පෙර එම මහනගර සභාව, නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව විසින් අනුගමනය කරන ලද කාර්ය පටිපාටියට නැවත අවතීර්ණ වීම වේ.

# පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

එල්.ඩී.—ඕ. 3/2014.

## 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2014 අංක දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට එය බලාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2. 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ අතුරු විධානය ඉවත් කිරීම මගින් එම පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.